**ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 18 දින පාලක ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,807.28 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,372.28 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුනු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 435.00 ක් හෙවත් සියයට 24.07 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 989.38 | 966.08 | 23.30 | 2.36 |
| මූලධන | 817.90 | 406.20 | 411.70 | 50.34 |
| **එකතුව** | **1,807.28** | **1,372.28** | **435.00** | **24.07** |

**2.2** **ආදායම් ගිණුම**

**--------------**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**-----------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා 20.03.02.07 දරන ආදායම් සංකේත සඳහා එකතුව රු.මිලියන 8,107.25 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 10,107.77 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 2,000.52 කින් හෙවත් සියයට 24.68 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

**2.3** **අත්තිකාරම් ගිණුම**

**------------------**

**2.3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**---------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 33.52 | 21.94 | 27.52 | 29.76 | 154.00 | 119.01 |

**2.4** **අග්‍රිම ගිණුම**

**-------------**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0032/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 41.81 ක් විය.

**2.5** **පොදු තැන්පත් ගිණුම**

**---------------------**

දෙපාර්තමේන්තුව යටතේ තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 0.42 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0084/000 | 0.10 |
| 6000/0000/00/0002/0112/000 | 0.11 |
| 6000/0000/00/0016/0059/000 | 0.21 |
| එකතුව | **0.42** |

## 2.6 විගණන නිරීක්ෂණය

---

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (v) | තොග පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 751 |

### 3.2 විසර්ජන ගිණුම

---

#### 3.2.1 අයවැය විචලනය

---

වැය විෂයයන් 13 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

---

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.109,500 ක්වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4** **ආදායම් ගිණුම**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් 20.03.02.07 දරන ආදායම් සංකේතය යටතේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් මුදල් පොතට අනුව පුරවැසි අංශයේ ආදායමේ එකතුව රු.මිලියන 849.81 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය අනුව එම ආදායම රු.මිලියන 849.99 ක් වූයෙන් එහි රු.181,430 ක වෙනසක් පැවතුණි.

(ආ) ආදායම් මුදල් පොතට අනුව වීසා රහිතව රැදී සිටි අයගෙන් අයකිරිම ආදායම හා දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය අනුව වීසා රහිතව රැදී සිටි අයගෙන් අයකිරීම් ආදායම අතර රු. 206,814 ක වෙනසක් පැවතුණි.

(ඇ) ද්විත්ව පුරවැසිභාවය ලබාදීම සඳහා පුද්ගලයෙකුගෙන් වැඩිපුර ලබාගෙන තිබූ රු.400,000 ක් වූ මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

**3.5** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.545,368 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක් සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.836,099 ක ණය නිලධාරීන් වෙත ප්‍රදානය කර තිබුණි.

**3.6** **අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94(1) | 25,748,085 | වැය විෂයයන් 13 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා එකතුව රු.මිලියන 25.75ක බැරකම්වලට එළඹ තිබුණි. |

**(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**-------------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | 4.2.3 මාර්ගෝපදෙශය | | මිල ගණන් විවෘත කර සති 02 ක් ඇතුළත තාක්ෂණික ඇගයීමේ කමිටුව ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතු වුවද, වීසා ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයේ ලංසු විවෘත කර දින 24 ක ප්‍රමාදයකින් පසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. |
| (ii) | 6.2.2 මාර්ගෝපදේශය | - | දෙපාර්තමේන්තුවේ පළමු හා බිම් මහලේ පරිගණක ජාලගත කිරීමේ සේවාව සඳහා ලංසු ඉදිරිපත් කිරිමට අවම වශයෙන් දින 7 ක් ලබා දිය යුතු වුවත්, ඒ සඳහා දින 1 ක් පමණක් ලබා දි තිබුණි. |
| (iii) | 8:9:1(ආ) මාර්ගෝපදේශය | 8,562,457 | භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් වටිනාකම රු.500,000 ක් ඉක්මවන අවස්ථාවලදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එලඹිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ පළමු මහලේ හා බිම් මහල නවීකරණය කිරීමේ හා ජාලගත කිරීමේ කොන්ත්‍රාත්ව සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |

**3.7 කාර්යසාධනය**

**---------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් මීනුවන්ගොඩ රැඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ප්‍රසම්පාදන කාර්යයන් 2015 දෙසැම්බර් 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

(ආ) ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට ජෛවමිතික දත්ත ඇතුළත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව වෙත ඡායාරූප ශාලා 1827 ක් ලියාපදිංචිය සඳහා අයදුම්පත් එවා තිබුණි. ඉන් ඡායාරූප ශාලා 1690 ක් මුදල් ගෙවා තම ලියාපදිංචිය තහවුරු කර ගෙන තිබුණි. එයින් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ඡායාරූප ශාලා 1154 ක් අතරින් 988 ක් නිරීක්ෂණ කටයුතු අවසන් කර දෙපාර්තර්මේන්තුව සමඟ මාර්ගගත

(online) ක්‍රමවේදය යටතේ සම්බන්ධ කර තිබුණි. ඒ අනුව ඡායාරූප ශාලා 166 ක් 2016 වර්ෂයේදී නිරීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීමට සූදානම් කර තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි. ලියාපදිංචි වූ සංඛ්‍යාවෙන් 988 දෙනෙක් හෙවත් සියයට 58 ක ප්‍රමාණයක් සේවය සැපයීමේ කටයුතුවල නිරත වී තිබුණි. සියයට 42 ක ප්‍රමාණයකින් මාර්ගගත ක්‍රමවේදය යටතේ සම්බන්ධ කර නොතිබුණි.

**3.8 පාඩු හා හානි**

-------------

2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා යන්ත්‍ර දෝෂ, මුද්‍රණ දෝෂ, ලැමිනේටින් දෝෂ හා වෙනත් හේතු මත අවලංගු කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව 4,818 ක් වූ අතර එහි පිරිවැය දළ වශයෙන් රු. මිලියන 2.4 ක් පමණ වී තිබුණි.

**3.9 අනාර්ථික ගනුදෙනු**

----------------------

මිනුවන්ගොඩ ගලගෙදර රැඳවුම් මධ්‍යස්ථානයේ ඉඩම පවරා ගැනීමට සහ එහි අදාළ ඉදිකිරීම් කටයුතු සඳහා රු.3,927,479 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් පසුව එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි.

**3.10 විසඳා නොතිබුණු විගණන ඡේද**

-----------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද සඳහා පසුවිපරම් කටයුතු නිම නොවී පැවතුණි. විස්තර පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2010 | 6.5 (a) | දෙපාර්තමේන්තුවේ 7.6.7 බී දරන පරිගණක වාර්තා අනුව 2013 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වීසා රහිතව රට තුළ රැඳී සිටි විදේශිකයන්ගේ සංඛ්‍යාව 13,192 ක් වී තිබුණි. එසේ රැඳී සිටින්නන් වැටලීමට හා අත්අඩංගුවට ගැනීම සිදුකරනු ලබන විමර්ශනයන්වලදී 255 දෙනෙකු පමණක් රටින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. එය වීසා රහිතව රැඳී සිටින්නන්ගෙන් සියයට 2 ක ප්‍රමාණයක් වී තිබුණි. |
| 2011 | 6.7 | |

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 60 | 56 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 398 | 357 | 41 |
| (iii) | ද්විතියික මට්ටම | 428 | 373 | 55 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 134 | 132 | 02 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 10 | 05 | 05 |
| | එකතුව | 1030 | 923 | 107 |